MARCH - MAY

# CURRENT ISSUES

ADIC
Alcohol and Drug Information Centre

# හැඳින්වීම

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC ආයතනය) වසර 30 කට වැඩි කාලයක් දුම්වැටි, මද්‍යසාර සහ අනෙකුත් මත්ද්‍රව්‍ය වලින් ජනතාව නිදහස් කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටියි. එම වැඩසටහන් අතර දුම්වැටි මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය වීමට බලපාන සාධක නිරන්තරයෙන් සොයා බලා ඒ පිළිබඳව ජනතාව සහ අදාළ බළධාරින්ගේ අවධානයට යොමු කරමින් ඒවායේ බලය අඩු කිරීමටත් එම බලපෑම් නතර කිරීම සඳහාත් කටයුතු කරයි.

ඒ අනුව ආයතනයේ පුස්තකාල හා තොරතුරු අංශය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුවත්පත් වන සිළුමිණ, දිනමිණ, දිවයින, මව්බිම, ලංකාදීප, අද, අරුණ, මොණරා ආදී පුවත්පත් දිනපතා විශ්ලේෂණයක් සිදු කරයි. මීට අමතරව විද්‍යුත් මාධ්‍ය නාලිකා කිහිපයක්ද නිරීක්ෂණය කරයි. එහිදී පහත කරුණු පිළිබඳව අවධානය යොමු කරයි.

- දුම්කොළ, මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම
- දුම්කොළ, මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය අධෛර්යමත් කිරීම
- දුම්කොළ, මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- දුම්කොළ, මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වැටලීම් සිදුකිරීම

මෙම වාර්තාව තුළ ඉහත කරුණු පුවත්පත්වල වාර්තා වී ඇති ආකාරය කෙසේද යන්න සම්බන්ධව සඳහන් වී ඇත. මෙහි අරමුණ වන්නෙ පුවත්පත් තුළ දුම්වැටි, මද්‍යසාර සහ අනිකුත් මත්ද්‍රව්‍ය වලින් සිදුවන ප්‍රවර්ධනයන් අවම කිරීම සහ මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව සිදුවන ධනාත්මක පළ කිරීම් පිළිබඳව ජනතාව සහ අදාළ බළධාරීන් දැනුවත් කිරීමයි.

# PRINT MEDIA

## PROMOTIONS













මද්‍යසාර සමාගම් විවිධ ආකාරයෙන් කාන්තාවන් රැවටීමට ලක් කරයි. ඇතැම් පුවත්පත් වල කාන්තාවන් මද්‍යසාර භාවිතා කරන රූප පළ කිරීම මඟින් කාන්තාවන් තුළ මද්‍යසාර භාවිතය උසස් යැයි වැරදි සම්මතයක් ඇති කරවමින් ඊට යොමු කරවීමට පුවත්පත් එම සමාගම් වලට උදව් කරයි.

පුවත්පත් තුළින් ඇතැම් කතා පුවත් පළ කිරීමේදී යොදා ගන්නා වාක්‍ය රටාවන් මඟින් මද්‍යසාර ප්‍රචාරණය වීම හා පාඨකයා තුළ වැරදි සමාජ අවබෝධයන් ඇති විය හැක.

## සූර්වෙන්න ගිහින් ගුටිනොකා බේරිලා



මොරගොල්ලාගම සිසිර කැලේගම

## කාකි කෝට් පිහිටෙන් සූර්වෙලා

දෙයියෝ සාක්කි

රුවන්වැල්ල - විමලරත්න සමරකෝන්

## බේබදු සැමියාට බිරිඳගෙන් තරු පෙනෙන පාඩමක්



මෙය සබරගමුව පළාතේ බලංගොඩට නොදුරු එක්තරා ගම්මානයක සිදුවූ අපූරු සිදුවීමකි. හෙතෙම මේ වළිනෙද කුලී රැකියාවේ සිටි අයෙකි. විවාහකව සිටි අතර දරුවෝ කිහිප දෙනෙක් ද සිටියහ.

ටිකක් කපටි කයිරාටකයෙකි. සවස් යාමයේ මත්පැන් පොදක් තොල ගෑමට අමතක නොකරන්නේය. මත්පැන් මිල ඉහළ යෑමත් සමඟ එය ටිකක් අසීරු කරුණක් විය.

මොහු මත්පැන් පානය කළ සමහර දිනවල දී ගෙදර බිරිය සමඟ අඬ දබර කර ගන්නේය. මත්පැන් මිල ඉහළයාමේ ප්‍රශ්නයට විසඳුම වශයෙන් ඔහු වත්ත අසන්නයේ තිබුණු කිතුල් ගසක මලක් කපා රා ටිකක් පානය කිරීමට පුරුදුව සිටියේය.

ඔහුගේ බිරියද ටිකක් සැර පරුෂ කාන්තාවකි. නිතර නිතර සිදුවන අඬ දබර ඉවසා සිටීමට නොහැකි කමින්, හිටපන් මම උඹට හොඳ වැඩක් කරන්නම් කියා දිනක් කීවාය.

පසු දින ඔහු කුලී රැකියාව අවසන් කර නිවසට පැමිණි කිතුල් මල කැපීමට පිහිය මදින්න පටන් ගත්තේය. ඔය පිහිය මදින්න දඟලන්න ඕනි නැහැ. ඔන්න මම කිතුල් මල මුලින්ම කපලා ගෙයි මුල්ලට ගෙනත් දැම්මා.

"දෙයියෝ සාක්කි,, මේ ගෑනි ගහේ නැගලා කිතුල් මල මුලින්ම කපලනෙ.,

ඔහුට කර කියා ගැනීමට කිසිවක් නොමැතිව දස අතේ කල්පනා කළේය.

බලංගොඩ වයි.ඒ.එස්. වීරවංශ


## කැවුම් කසිප්පු වී කූඩුවේ ලැගලා



මාදම්පේ එස්. හේරත්

## සූර්පිට මළ බෙරෙන් බජව් වයලා

බලංගොඩ වයි.ඒ.එස් වීරවංශ



දෙයියෝ සාක්කි

# PRINT MEDIA

## PREVENTION



දුම්කොළ සමාගම්වල ඉලක්කය ළමයින් සහ තරුණයන්

– මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය



දුම්කොළවලින් සිසුන් රැසකට මුඛ පිළිකා

වෛද්‍ය විශේෂඥ මහාචාර්ය හේමන්ත අමරසිංහ

චම්පිකා දීපානි

ශ්‍රී ලංකාවේ මුඛ පිළිකාවෙන් දිනකට රෝගීන් තිදෙනකු මිය යන බවත් ඒ අනුව වසරකට දළ වශයෙන් දහසකට අධික රෝගීන් සංඛ්‍යාවක් මිය යන බවත් දන්ත ශල්‍ය වෛද්‍ය විශේෂඥ, මහාචාර්ය හේමන්ත අමරසිංහ පවසයි.

2 පිටුවට



Today is World No-Tobacco Day

TOBACCO-FREE GENERATION: A VISION FOR A HEALTHIER FUTURE FOR SRI LANKA

By Dr. Anula Wijesundere and Dr. Surantha Perera

Tobacco kills. It often maims before it kills, as it is capable of harming all organs in the body. It robs the potential of its countless victims and their families. Children are particularly vulnerable to the influencing of the tobacco industry, which targets them as future smokers. The addictive nature of tobacco undermines the true freedom of choice of its users. Every year, thousands of young people in Sri Lanka become victims of its addictive grip.



SLMA URGES GOVT. TO IMPLEMENT TOBACCO BAN FOR THOSE BORN AFTER 2010

Initiative aims to create a "Tobacco-Free Generation"

Prevents children from exposure to tobacco-related harm

By HUZEFA ALIASGER

The Sri Lanka Medical Association (SLMA) in a press release said that a policy on banning tobacco consumption for those born after 2010 is presented to the government and urges the government to take action on this policy in lieu of the upcoming World No Tobacco Day.

The SLMA said, "The Tobacco-Free Generation is a policy initiative where the sale of tobacco is banned for all those born after a specific year – for example, 2010. It is a concept rooted in ethical considerations that prioritise the health and well-being of future generations, based on the principles of human rights and social justice. It ensures that children are not subjected to preventable harm. It will also ensure significant social and economic gains."

The policy by SLMA is also justified through international child rights and human rights instruments, which emphasise the protection and well-being of children. The right to health and life is a fundamental human right recognised in various international treaties, including the Universal Declaration of Human Rights. The wording of the National Authority on Tobacco and Alcohol Act (2006) of Sri Lanka also supports the objectives of this concept.

The WHO Framework Convention on Tobacco Control (FCTC) states the need for protection from exposure to tobacco smoke, particularly for vulnerable populations such as children, recommends banning sales to those below a specific age, and mandates protecting children from the manipulative marketing tactics of the tobacco industry.

The SLMA said that the benefit of this policy will significantly reduce the healthcare costs of tobacco use, which run into billions of rupees each year. "It is also well established that smokers tend to take more sick days and may experience decreased productivity while at work due to health issues related to smoking. This initiative will therefore ensure a healthier workforce that is more productive, over the years."


දුම්කොළ නිවාරණ දිනය තේමා කරගනිමින් පුවත්පත් තුළ ලිපි පළ වූ අතර පුවත්පත් මාධ්‍ය තුළින් ජනතාව වෙනුවෙන් සිදු කරන මෙම දැනුවත් කිරීම අගය කළ යුතුය.



මාරයාගේ දූතයා දුම්වැටිය

# PRINT MEDIA

## LAW ENFORCEMENT



### උඩින් ගෙනා ලක්ෂ 44 ක රට සිගරැට් අල්ලයි

■ කටුනායක ටී.කේ.ජී.කපිල

**රුපියල් හතළිස් හතර ලක්ෂ හතළිස් පන් දහසක් වටිනා විදේශීය නිෂ්පාදිත දුම්වැටි තොගයක් නීතිවිරෝධී ලෙස මෙරටට රැගෙන විත්, ඒවා කටුනායක ගුවන් තොටුපොළෙන් පිටතට ගෙන යාමට තැත් කළ ශ්‍රී ලාංකික ගුවන් මගියෙක් ගුවන් තොටුපොළ රේගු නිලධාරීන් විසින් ඊයේ (05) උදෑසන අත්අඩංගුවට ගනු ලැබීය.**

මොහු ඩුබායි හි රියැදුරෙකු ලෙස රැකියාවක නිරත වී සිටි කුරුණෑගල ප්‍රදේශයේ පදිංචි 29 හැවිරිදි තරුණයෙකි. ඔහු රේගු නිලධාරීන්ගේ අවධානය වෙනතකට යොමු කිරීම සඳහා මෙම දුම්වැටි තොගය ඩුබායිවලින් මිලදී ගෙන, බහරේනය වෙත පැමිණ, එතැන් සිට ගල්ෆ් එයාර් ගුවන් සේවයේ ජී.එෆ්.- 144 දරන ගුවන් යානයෙන් කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණ තිබුණි.

දුම්වැටි 25,400 ක් අඩංගු දුම්වැටි කාටූන් 127 ක් රේගු නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත. මේ පිළිබඳ විධිමත් රේගු විමර්ශනයක් පවත්වා ඇති අතර, එහිදී මෙම දුම්වැටි තොගය රාජසන්තක කර, මේවා නීතිවිරෝධී ලෙස මෙරටට රැගෙන ආ ගුවන් මගියාට රුපියල් ලක්ෂයක දඩ මුදලක් ගෙවන ලෙසද නියෝග කර ඇත.

2025.05.06 ලංකාදීප

රට තුළ නීති ගත කර ඇති සිගරට් නිසා ඇති වී තිබෙන කරදරය දැන දැනත් තවත් සිගරට් රට තුළට ගේන්න ඉඩ නොදිය යුතුය.



### රු. කෝටි 04ක් වටිනා විදෙස් දුම්වැටි හා බීඩිකොළ කල්පිටියෙන් අල්ලයි



### ලක්ෂ 44ක රට සිගරැට් ගෙනා මගියෙක් කටුනායකදී අල්ලයි

කටුනායක - ගයා හිරිමාදුර

රුපියල් හතළිස්හතර ලක්ෂ හතළිස්පන් දහසක් වටිනා විදේශීය නිෂ්පාදිත දුම්වැටි තොගයක් නීති විරෝධී ලෙස මෙරටට රැගෙනවිත්, ඒවා කටුනායක ගුවන් තොටුපොළෙන් පිටතට ගෙන යෑමට තැත් කළ ශ්‍රී ලාංකික ගුවන් මගියකු ගුවන් තොටුපොළ රේගු නිලධාරීන් විසින් ඊයේ (05දා) උදෑසන අත්අඩංගුවට ගෙන තිබේ.

මොහු ඩුබායිහි රියැදුරුවරයකු ලෙස රැකියාවක නිරත වී සිටි කුරුණෑගල ප්‍රදේශයේ පදිංචි 29 හැවිරිදි තරුණයෙකි.

ඔහු රේගු නිලධාරීන්ගේ අවධානය වෙනතකට යොමු කිරීම සඳහා මෙම දුම්වැටි තොගය ඩුබායිවලින් මිලදී ගෙන, බහරේනය වෙත පැමිණ එතැන් සිට ගල්ෆ් එයාර් ගුවන් සේවයේ ජී.එෆ්.- 144 දරන ගුවන් යානයෙන් කටුනායක ගුවන් තොටුපොළ වෙත ගෙනවිත් තිබිණි.

ඔහු විසින් රැගෙන ආ ගමන් මලු තුළ තිබී හමුවූ 'ප්ලැටිනම් ඩබල් මික්ස්' (Platinum Double Mix) නමැති මෙම දුම්වැටි මගින්, '' 'ස්විචයන්' දෙකක් ක්‍රියාත්මක කර, රස දෙකක් උත්පාදනය කළ හැකි දුම්වැටි විශේෂයකි.

එවැනි දුම්වැටි 25,400 ක් අඩංගු දුම්වැටි කාටූන් 127ක් රේගු නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

මේ පිළිබඳ විධිමත් රේගු විමර්ශනයක් පවත්වා ඇති අතර, එහිදී මෙම දුම්වැටි තොගය රාජසන්තක කර, මේවා නීතිවිරෝධී ලෙස මෙරටට රැගෙන ආ ගුවන් මගියාට රුපියල් ලක්ෂයක දඩ මුදලක් ගෙවන ලෙසද නියෝග කර තිබේ.



### ලක්ෂ 34ක රට සිගරැට් ගෙනා මගියෙක් කටුනායකදී කොටු

## මෙවැනි නීති විරෝධී මත්ද්‍රව්‍ය පාලනයට ගත හැකි හොඳම පියවර නීතිය ක්‍රියාත්මක කිරීමයි.

**අප්‍රේල් 03-12 අතර**

**හොර අරක්කු ජාවාරම් 1,320ක්**

2025/4/17 බොහර

**1,320 දෙනෙක් අත්අඩංගුවට**

**වැටලීම්වලින් බහුතරයක් 1913ට ලැබුණු ඔත්තු මත**

**සුරාබදු දෙපාර්තමේන්තුවෙන් හෙළිදරව්වක්**

| බද්දේගම - මිහිඳු කමලනාථ

සුරාබදු දෙපාර්තමේන්තුව අප්‍රේල් 03 සිට 12 වැනිදා දක්වා සිංහල අලුත් අවුරුදු සමය තුළ දිවයින පුරා නීති විරෝධී මත්පැන් සම්බන්ධ වැටලීම් 1,320ක් කර පුද්ගලයන් 1,320 දෙනකු සැකපිට අත්අඩංගුවට ගෙන ඇතැයි ඒ දෙපාර්තමේන්තුව නිකුත් කළ නිවේදනයක සඳහන් වෙයි.

පිටුව 02

**රු.කෝටි 80ක මත්ද්‍රව්‍ය සමග අයෙක් අත්අඩංගුවට**

**- මත්ද්‍රව්‍ය තොගය බන්ධනාගාරගතව සිටින මොරීන්ගේ බවට තොරතුරු**

2025.04.28 දිවයින



>>P2

**නීතිවිරෝධී මත්පැන් බෝතල් 20ක් සමග මැතිවරණ අපේක්ෂකයා අත්අඩංගුවට**

● එන්. කේ. හිශ්ශංක මීගහකිවුල

මෙවර පළාත් පාලන මැතිවරණයේ දී හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව සඳහා තරග වදින අපේක්ෂකයෙකු පෙරේදා (05දා) රාත්‍රී 11.30 ට පමණ නීති විරෝධී මත්පැන් බෝතල් 20ක් සමග පුනාගලවත්ත ප්‍රදේශයේ දී අත් අඩංගුවට ගත් බව ලියන්ගහවෙල පොලීසිය පවසයි.

අත් අඩංගුවට ගෙන ඇත්තේ කර්මාන්තශාලා කොටස පුනාගල වත්ත පුනාගල පදිංචි 31 හැවිරිදි පුද්ගලයෙකි.

පොලීසිය වෙත ලද තොරතුරක් මත ලියන්ගහවෙල පොලීසියේ නිලධාරීහු පිරිසක් සැකකරු හා ඔහු සතුව තිබූ මත්පැන් තොගය අත්අඩංගුවට ගෙන ඇත.සැකකරුට එරෙහිව නඩුපැවරීමට නියමිතය.

ලියන්ගහවෙල පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

**අසූලක්ෂයක කුෂ් එක්ක ජාවාරමෙක් කොටු**



2025.4.23 - ලංකාදීප

**ලක්ෂ 600ක කේ.ජී. පේදුරුතුඩුවේදී අල්ලයි**

2025.03.24 බොහර

| නිශාන්ත කුමාර බණ්ඩාර

යුද හමුදා බුද්ධි අංශය සහ පේදුරුතුඩුව පොලිසිය ඒකාබද්ධව සිදුකළ මෙහෙයුමකින් රුපියල් මිලියන 60ක් වටිනා කේරළ ගංජා තොගයක් අත්අඩංගුවට ගෙන තිබේ.

පේදුරුතුඩුව තුම්පල් ප්‍රදේශයේදී මෙම කේරළ ගංජා තොගය පෙරේදා (22 දා) අලුයම් කාලයේදී අත්අඩංගුවට ගත් බව යුද හමුදා මාධ්‍ය ඒකකය පැවසීය.

පේදුරුතුඩුව මුක්කම් වෙරළ තීරය ඔස්සේ ප්‍රවාහනය කරමින් තිබූ මෙම ගංජා තොගයේ බර කිලෝග්‍රෑම් 350ක් පමණ වන බව හමුදා මාධ්‍ය ඒකකය සඳහන් කළේය.

පාර්සල් 154ක් ලෙස සකසා තිබූ මෙම ගංජා තොගය සහ ඒවා ප්‍රවාහනය කළ බෝට්ටු වැඩිදුර පරීක්ෂණ සඳහා පේදුරුතුඩුව පොලිසිය වෙත භාර දී තිබේ.

# DIGITAL MEDIA

## PROMOTIONS



Salena Nuwan (සැලෙනා නුවන්) | Episode 227 | 08th February 2025

දෙරණ නාලිකාවේ සති අන්තයේ විකාශය වන සැලෙනා නුවන් ටෙලි නාට්‍ය තුළ මධ්‍යසාර ප්‍රවර්ධනය කරන ආකාරය.



Recondition Kella || EPISODE 51 || රීකන්ඩිශන් කෙල්ල || 08th February 2025


ස්වර්ණවාහිනී නාලිකාවේ සති අන්තයේ විකාශය වන රීකන්ඩිශන් කෙල්ල ටෙලි නාට්‍ය තුළ මද්‍යසාර ප්‍රචාරණය කරමින් කාන්තාවන් ද මෙයට හසුකර ගැනීමට ගන්නා උත්සාහය.



Maayavi (මායාවී) | Episode 113 | 07th February 2025 | Sirasa TV

සිරස නාලිකාවේ සතියේ දින වල විකාශය වන මායාවී ටෙලි නාට්‍ය තුළ මද්‍යසාර භාවිතය ප්‍රවර්ධනය කරන ආකාරය.

**2006 අංක 27 දරණ දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනත මගින් දුම්කොළ සහ මද්‍යසාර ප්‍රචාරණය තහනම් කර තිබියදීත් රූපවාහිනී නාලිකාවල මද්‍යසාර ප්‍රචාරණය කරන ආකාරය සහ කාන්තාවන් මේ සඳහා පොළඹවා ගැනීමට දරන උත්සාහය**







**ITN නාලිකාවේ සති අන්තයේ විකාශය වන වීදුරු තිර ටෙලි නාට්‍ය තුළ මද්‍යසාර භාවිතය ප්‍රවර්ධනය කරමින් කාන්තාවන් තුළ භාවිතය සාමාන්‍යකරණය කිරීමට ගන්නා උත්සාහය.**






**ITN නාලිකාවේ සතියේ දිනවල විකාශය වන විසේකාරී ටෙලි නාට්‍ය තුළ විශ්ව විද්‍යාල සිසුන් සතුව තිබූ ගංජා බොඳ නොකළ දසුන් සමඟ විකාශය කිරීම**







**ස්වර්ණවාහිනී නාලිකාවේ සති අන්තයේ විකාශය වන රට පවුල ටෙලි නාට්‍ය තුළ මද්‍යසාර භාවිතය ප්‍රවර්ධනය කරන ආකාරය**

# ජනමාධ්‍යක සමාජ මෙහෙවර නම්!